# බුදුදහමේ ක්‍රිස්තියානි ආභාසයඃ බෞද්ධ වෙසක් කාඩ් හා භක්ති ගීත ඇසුරෙන්

**උලපනේ ධම්මානන්ද හිමි**[1]

## හැඳින්වීම

සම්බුදු තෙමඟුල සිහිකරමින් පවත්වනු ලබන ආමිසපූජා බොහෝ ය. වර්තමානයේ එහි ලා ප්‍රකට සැරසිලි, නිර්මාණ සහ ප්‍රකාශන අතර වෙසක් කාඩ්පත් සහ වෙසක් භක්ති ගීත ඩිජිටල්කරණය දක්වා විකාශනය වී ඇත. බටහිර ආක්‍රමණ හමුවේ ක්‍රිස්තියානි ආභාසය අනුව සැකසුණු වෙසක් කාඩ් හා භක්ති ගීත බුදු සමයේ සෞන්දර්ය පැතිකඩ විද්‍යමාන කරයි. බුදුදහමේ සංස්කරණවාදී ප්‍රවේශයක් වූ ක්‍රිස්තියානි ආභාසය සහිත බුදුදහම හේතුවෙන් මුල්කාලීන වෙසඟේ තිබූ බුද්ධාලම්භන ප්‍රීතිය උපදවා ගැනීම යන්න ගිලිහී ප්‍රීති මංගල්‍යයක් බවට පත් වී ඇති අයුරු Merry Christmas හෝ Happy Christmas hkak Happy Wesak ලෙස භාවිතයට පැමිණීමෙන් ප්‍රකට වේ. එසේ ම වෙසක් බැති ගීය ද ක්‍රිස්තියානි කැරොල් ආභාසය ඇති භක්තිමය බුද්ධාභිවාදනයක් ලෙස පෙනේ. මෙසේ 18, 19 වන සියවස්වල මෙරට සිදු වූ ආගමික පුනරුදයත් සමඟ බුදුදහම ක්‍රිස්තියානි සංස්කෘතිය හා මුසුවීමේ ලක්ෂණ වෙසක් කාඩ් හා වෙසක් භක්ති ගීත තුළින් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය මත පදනම් ව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගැනීම හා සාකච්ඡා ක්‍රම මෙහි දී අනුගමනය කොට ඇත.

## සාකච්ඡාව

වෙසක් උත්සව සැමරීමේ ඉතිහාසය ක්‍රි.ව. පස්වන සියවස තෙක් දිවයයි. පාහියන් හිමියන් විසින් ඉන්දියාවේ සමරන ලද වෙසක් උත්සවයක් දුටු බවට මූලාශ්‍රය මගින් අනාවරණය වේ (බලගල්ලේ,2017:76,77). ශ්‍රී ලාංකේය වෙසක් උත්සවය අනුරාධපුර යුගයේ දුටුගැමුණු සමයෙහි ආරම්භ ව දඹදෙණි යුගයේ දී ඉතා උත්සවශ්‍රීයෙන් සැමරූ බවට පූජාවලිය තුළින් තොරතුරු හෙළිවන අතර මහනුවර යුගය වනවිට වෙසක් උත්සවය පැවැත්විය යුතු ආකාරය දක්වමින් නීති මාලාවක් ද වූ බව මහාවංසය වාර්තා කරයි. රිචඩ් ගොම්බ්‍රිජ් හා ගනනාථ ඔබේසේකරයන්ගේ 1998 "Buddhism Transformed: Religious Change in Sri Lanka" නම් කෘතිය පෙන්වාදෙන්නේ මෙරට වෙසක් සංස්කෘතියේ වර්ධනය සඳහා ක්‍රිස්තියානි ජනයාගේ නත්තල් සංස්කෘතිය බලපෑම් කළ බව යි. ක්‍රි.ව. හත්වන සියවසින් පසු "වෙසාඛ කීළං"(සුමංගල හිමි,2011:236,467) හෙවත් වෙසක් කෙළි නමින් ප්‍රතිපත්ති පූජාවට වඩා සැණකෙළි හුරුවට වෙසක් සංස්කෘතිය

1. කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.

යොමු වීම දක්නට ලැබිණි. මුල්කාලීනව දුගී-මගී යාචකාදීන් රැස්කරවා දානමය පිංකම් සිදු කරමින් කළ වෙසක් උත්සවය අද වනවිට දන්සල් දක්වා ද, පහන් දැල්ල නිවී නොයාමට උපක්‍රමයක් ලෙස යෙදූ ආවරණය විදුලි ආලෝක පහන් කූඩුව දක්වා ද සහ පහන් කූඩු සන්දර්ශන දක්වා ද වර්ධනය වූයේ කාලීන ප්‍රවණතා වශයෙනි. වෙසක් උත්සවය හා සම්බන්ධ නූතන ප්‍රවණතාවක් වන වෙසක් කාඩ් භාවිතයේ ඉතිහාසය 19 සියවස තරම් අතීතයකට විහිදෙයි. එනම් ප්‍රවීණ පරිවර්තක සේනාරත්න වීරසිංහ මහතා පෙන්වා දෙන පරිදි බ්‍රිතාන්‍යයේ නත්තල් සුබපැතුම් ක්‍රමය යටත්විජිතකරණයත් සමඟ ලංකාවට පැමිණ ඇත. වෙසක් සුබපැතුම්පත් මුද්‍රණයේ දී කලෛමගල් සහ ලලිත කලාලේ නම් ආයතන වැදගත් අතර ලලිත කලාලේ ආයතනය මුද්‍රිත පත්වල බුදුසිරිතේ සිදුවීම් අලංකාර සිත්තමට නඟා තිබීමත් පසුපිට අපූරු කවි නිර්මාණත් විය. වෙසක් කාඩ් නිර්මාණකරණයේ තවත් අවස්ථාවක් ඉන්දීය මුද්‍රණයක් ලෙස ඩීමන් ආනන්ද මහතා යටතේ පෙනේ. චිත්‍රකතා ගොන්නක් සහිත පත්තර ද 70-80 දශකවල දී පැමිණි අතර එහි වෙසක් සතියේ දී ඊට නොමිලේ වෙසක් පතක් තිළිණ විය. දේදුනු කැලුම් යුවල ආදි චිත්‍රකතා චරිතවලට මුසපත් වූ තරුණ පරපුර පෙම් කළ අතර වෙසක් පතට දේදුනු සහ කැලුම් එක් විය. ඔවුන් පන්සලට මල් පහන් රැගෙන යන චිත්‍ර එහි විය. බුදුසිරිත අතුරුදන් විය. අවසන වාණිජකරණය වූ එය love card එකක්ම විය. ඒවායේ මල්, මොනර යුවල, කුරුලු යුවල වැනි ඡායාරූපයට අදාළ ලෙස කවිය ද ප්‍රේමාන්විත විය. මේ සමඟ වෙසක් කාඩ් සඳහා බුදුරුව යොදාගැනීම සම්බන්ධ මතවාද සමාජගත වීමේ ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ දී බුද්ධසාසන අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කරමින් බුදුරුව යොදා නොගත යුතු බවත් බෞද්ධ කලාව හා බෞද්ධ සංකේත පමණක් යොදාගත යුතු බවත් සඳහන් කරන ලදි. ඩිජිටල්කරණය හරහා වෙසක් කාඩ් සමාජය තුළ භෞතිකව සංසරණය වීම අභාවයට ගිය අතර එය ඡායාරූප සහ සංගීත මුසු වීඩියෝ පට දක්වා ව්‍යාප්තව තේමා මෙන් ම හැඩය ද යාවත්කාලීන වෙමින් පවතී.

**භක්ති ගීත**

වෙසක් උත්සවය හා බැඳුණු පශ්චාත් කාලීන ප්‍රවණතාවක් වුව ද එය දීර්ඝ ඉතිහාසයක් ඇත. භක්ති ගීත ගායනයේ ලාංකේය විකාසනයේ ආරම්භය 19 වන සියවසේ දී පමණ වන බවට තොරතුරු හෙළිවන අතර එහි ඉතිහාසය අනුරාධපුරය යුගය දක්වා දිවයයි. එනම් කිරින්ද ගිරිලිපියෙන් ලක්දිව පළමු බුදුගුණ ගීයට අයත් සාධක සොයාගෙන ඇත. එසේ ආරම්භ වූ මෙරට බුදුගුණ වර්ණිත කාව්‍ය සාහිත්‍යයෙහි ආරම්භයේ කතාව මෙරට බටහිරකරණයත් සමග වෙනස් මඟක් ගනිමින් ලාංකේය වෙසක් සංස්කෘතියටම ආවේණික අංගයක් ලෙස නොව ක්‍රිස්තියානි දහමෙන් ලක්දිව බුදුසමයට එක් වූ නව්‍යාංගයක් ලෙස විකාශනය විය. එංගලන්තයේ කැරොල් ගායනය ලංකාවට ලැබුණේ මිෂනාරීන් විසින් මෙරට සිය ආගම පතුරුවා හැරීමට දරන ලද ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙනි. සිංහල ශබ්දකෝෂය අරුත් ගන්වන පරිදි කැරොල් යනු නත්තල් උත්සවය හෝ වෙසක් උත්සවය වෙනුවෙන් ගීතිකා කණ්ඩායම් විසින් පවත්වනු ලබන භක්ති ගීත ගායනා වේ. මෙරට පෘතුගීසි පාලන සමයේ පටන් ම කැරොල් ගායනය තිබූ අතර ලන්දේසීන් යටතේ එය සිංහල සම්භවයක් සහිතව තවත් වර්ධනය විය. 1730 ගොන්සාල්වේස් පියතුමාගේ මංගල ගීතයෙන් ඇරඹී සිංහල කැරොල් ගීත කලාව 1945 පමණ වනවිට මර්සලින් ජයකොඩි පියතුමා යටතේ සිංහල සංස්කෘතිය හා බද්ධ වීම දැකිය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස ඉංග්‍රීසි ගීතිකාවල ආභාසය ලැබූ බැතිමතුන් සිංහල

ගීත රචනා කළා පමණක් නොව ඒවා සභාවෙහි ගායනා ද කළ අතර මුල්කාලීන ඒවාහි දේව යාඥා ස්වරූපයක් දක්නට ලැබෙයි. මෙසේ 1886 මැයි මස 17 වන දින ලාංකේය ක්‍රිස්තියානි සංස්කෘතියට ප්‍රතිබාධකයක් ලෙස ආරම්භ වූ වෙසක් කැරොල් ගායනය මෙරට සංස්කෘතියට නවමු අංගයක් වුවද කාලීන අවශ්‍යතාවක් සම්පූර්ණ කරන ලදි. මේ අයුරින් විකාශය වූ වෙසක් භක්ති ගීත ඉතිහාසයේ 1893 වන විට විශේෂ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් වෛශාඛ බෞද්ධ සංගීතය නමින් ග්‍රන්ථ පිටපත් තුන්දහසක පමණ ප්‍රමාණයක් මුද්‍රණය කරන ලදි. මෙසේ පැමිණි සිංහල කැරොල් ගීත ගායනය භක්ති ගීත ගායනය බවට සම්පූර්ණ වශයෙන් ම වෙනස් වී පැමිණෙන්නේ 2500 වැනි සම්බුද්ධ ජයන්තියෙන් පසුව ය. එසේ සිංහලයන්ට උත්සවශ්‍රීයෙන් වෙසක් දවස ගෙවන්නට තිබූ අවස්ථාව පරම්පරානුගත වීමේ ප්‍රතිඵලයක් ලෙස කැරොල් ගීතය බුදුගුණ කවි, බෞද්ධ ගීත, සිලෝ, ස්තුති පූජා කාව්‍ය, බුදුගුණ සින්දුව, බුදුගුණ කවිකලාව, බුදුගුණ ගී ආදී නොයෙන් නම්වලින් පසුකාලීනව ව්‍යවහාර විය. මෙසේ 1886 වසරේ "අදයි වෙසක් දා - සොම්නස සතුට උපන් දා"(Pahanruwa,2013) යන ගීතයෙන් ඇරඹි බෞද්ධ කැරොල් ගී ගායනය සියවස් දෙකකට ආසන්න කාලයක් පටන් වෙසක් සංස්කෘතිය හා බද්ධව පවතියි. බුදුසිරිත, ජාතක කතා, බෝසත්සිරිත සම්බන්ධ සිදුවීම්, බෞද්ධ සංකල්ප, රුවන්වැලිසෑය, ජය ශ්‍රී මහා බෝධිය ආදී ආගමික ස්ථාන, බුදුබැතිය, සසර ගමන ආදී තේමා පදනම් කරගනිමින් බුද්ධාලම්භන ප්‍රීතිය ජනිත කිරීම, බුද්ධ රූපකාය, ධර්මකාය වර්ණනා කිරීම එහි අරමුණු වූ බව පෙනෙයි. එසේ වුව වර්තමානය වනවිට බොදු ගීත ශානරය පුරන් වූ සෙයක් දක්නට ලැබේ. විශේෂයෙන්ම ගේය පද රචකයන්ගේ අල්පශ්‍රැතභාවය නිසා බොහෝ විට හරසුන් නිර්මාණ බිහිවන අතර එය ජන විඥානයේ උසස් රසවින්දනයට බාධා පමුණුවයි. බුදුදහම පිළිබඳ ව නිසි අවබෝධයක් නොමැති පිරිස් ගීත රචනයට යොමු වීම, බොදු ගීතයක තිබිය යුතු දැමුණු නිවුණු ස්වභාවය ඈත්වීම මීට හේතු වී තිබේ.

මෙහි දී බෞද්ධ පුනරුදය මෙහෙය වූ ධර්මපාලතුමා, ඕල්කට්තුමා වැනි මධ්‍යම පාන්තිකයන්ගේ බටහිර ආභාසය ද බුදුසමයේ ප්‍රොතෙස්තන්තකරණයට බලපා ඇත. ඒ අනුව 18, 19 සියවස්වල සිදු වූ නව ආගමික පුනරුදයත් සමඟ වෙසක් කාඩ් සහ භක්ති ගීත ක්‍රිස්තියානි ආගම හා මුසුවෙමින් බෞද්ධ අනන්‍යතාවයක් වූ බව ප්‍රකට වෙයි.

**නිගමනය**

දහසය වන සියවසේ පෘතුගීසි ආක්‍රමණයේ පටන් ඉංග්‍රීසි පාලන සමය අවසන තෙක් බෞද්ධාගමික උත්සවයන්ට දැඩි නීතිරීති පැනවූ හෙයින් ශ්‍රී ලංකාවේ බුදුදහම හා ගොඩනැගුණු පූජා සංස්කෘතිය අඩපණ විය. එහෙත් නූතන යටත්විජිතකරණයෙන් මිදී පුනර්ජීවය ලබන බෞද්ධ ප්‍රජාව ක්‍රිස්තියානි ආගම හා මුසු වූ සැරසිලි නිර්මාණ බෞද්ධ උරුවට සකස් කරමින් බෞද්ධාගමික උත්සව සංස්කෘතිය යාවත්කාලීන කරන ලදි. ඊට වෙසක් කාඩ් සහ භක්ති ගීත ප්‍රමුඛ උදාහරණ වෙයි. කිතුනුවන්ගේ නත්තල් සුබපැතුම් පත බෞද්ධ අනුවාදය අනුව ගොඩනැගෙමින් විකාශය වූ වෙසක් කාඩ් වත්මනෙහි වෙසක් සංස්කෘතිය හා බැඳුණු ජනප්‍රිය අංගයක් බවට පත්ව ඩිජිටල්කරණය වීමත් සමඟ සමාජයේ භෞතිකව සංසරණය වීම අවම වී ඇත. භක්ති ගීතය ද යාඥාවක ස්වරූපයෙන් ආරම්භ වී කලක් විශිෂ්ට නිර්මාණ බිහි වුව ද වත්මන වනවිට අවර ගණයේ නිර්මාණ බිහිවන ප්‍රවණතාවක් දක්නට ලැබේ. ඒ අනුව ආරම්භයේ සිට ම වෙසක් උත්සවයේ

**කාලීන පරිවර්තනය අද දක්වා සිදු වී ඇති අතර ඊට විවිධ සමාජ පරිවර්තන මෙන් ම නව්‍යකරණය වන ලෝකය ද හේතු වී තිබේ. බුදුසමය කෙළෙස් ඇති නොකරවන කිසිඳු සැමරුමකට විරුද්ධ නොවන අතර වෙසක්පත් මෙන් ම ගීතයත් භක්තියෙන් මිදී ශ්‍රද්ධාව හා මිනිස් ගුණ වඩනු පිණිස පක්ෂය. වැදගත් වන්නේ බුදුසමයේ මූලික අර්ථය නොනසා නූතන සංස්කරණ සිදු කිරීම ය.**

**මුඛ්‍ය පදඃ ක්‍රිස්තියානි, බුදුදහම, භක්ති ගීත, යටත්විජිතකරණය, වෙසක් කාඩ්**

**ආශ්‍රිත ග්‍රන්ථ**

ද සිල්වාල ප්‍රේමකුමාර, සංස් (2009). *යටත් විජිත බුදුදහම,* කොළඹ 10ඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1959). *ඌන පූරණ සහිත මහාවංසො,* කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සමාගම

බලගල්ලේ, විමල් ජී (2017). *බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව* කොළඹ 10ඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

සිරි සුමංගල හිමි, මඩිතියවෙල (2011). *පාලි-සිංහල ශබ්ද කෝෂය*, කොළඹ 10ඃ සෝමාවතී හේවාවිතාරණ භාරය.

හේවාමානගේ, විමල් (2006). *බෞද්ධ පූජා චාරිත්‍ර හා සාහිත්‍යය*, කොළඹ 10ඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

Percy Dear Mer, R Vaughe Williams, Martin Shaw (1946) The oxford book of carols.

Richard Gombrich & Gananath Obesekere (1998). *Buddhism Transformed:* Religious Change in Sri Lanka, America: 'P.U.P' Princeton, New Jlsis÷ ersey.

තක්සලාව (ලිපි), (මාර්තු 10.2024) වෙසක් සුබපැතුම්පතේ කතාව, ඉරිදා ලංකාදීප.

බීබීසී නිවුස් (ලිපි), (අප්‍රේල් 30, 2018) මතකයෙන් ඈත්වෙන සුබපැතුම්පත්.

Pahanruwa, (2024) ගීතයේ අන්තර්ගත බෞද්ධ සංකල්ප (වික්ටර් රත්නායකයන් ගායනා කර ඇති ගී ඇසුරෙන්) http://pahanruwa.blogspot.com/2013/09/blog-post_4234.html?m=1.